සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/08/1/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2023.10.04

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක ජනරාල් වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම් වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ වරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජා මුල බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,කළමනාකරුවන් වෙත.

**<u>අඩු ආදායම්ලාභී හා අවදානමට ලක් වූ පවුල් සඳහා ක්‍රියාත්මක කරනු ලබන ජීවනෝපාය ව්‍යාපෘති සඳහා පවතින දේශීය වෙළඳපල පිළිබඳ විශ්ලේෂණය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2023.08.31 දිනැති ලිපිය හා බැඳේ.

02. උක්ත වැඩසටහන යටතේ වෙළඳපොල අවස්ථා හඳුනාගැනීමේ දින ½ වැඩමුළුව ඔබ කොට්ඨාශයන් හී සාර්ථකව ක්‍රියාත්මක කර කොට්ඨාශයට සුදුසුම ව්‍යාපෘති 8-10 ක් හඳුනාගැනීමට දායක වූ සියළුම නිලධාරීන්ට කෘතඥතාවය පුද කරමි.

03.එම වැඩමුළුව ක්‍රියාත්මක කිරීමේදී තේ පැන් සහ ලිපි ද්‍රව්‍ය සඳහා වැය කරන ලද රු: 10,500.00 ක මුදල නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත අදාල කොට්ඨාශයන් හී සමෘද්ධි බැංකු සමිති වියදම් දැරීමට මාගේ උක්ත ලිපිය මගින් අනුමැතිය ලබාදෙන ලදී.

04. මෙම වැඩසටහනෙන් අනතුරුව ක්ෂේත්‍රයට ගොස් සිදුකල යුතු වෙළඳපොල සමීක්ෂණය වෙනුවෙන් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට උපරිම රු: 14,000.00 ක් වෙන් කර ඇත. වෙළඳපොල විශ්ලේෂණ දෙදින වැඩමුළුවට සහභාගී වූ නිලධාරියා ඇතුළුව සමීක්ෂණය සඳහා සීමිත නිලධාරීන් පිරිසක් මේ සඳහා සහභාගී කරවීම සුදුසු වන අතර , මේ සම්බන්ධයෙන් වැඩමුළුවට සහභාගී වූ නිලධාරින් දැනුවත් කර ඇත.

05. මෙම සමීක්ෂණයට සහභාගී වන නිලධාරීන්ගේ ගමන් වියදම් සඳහා මෙම රු: 14,000.00 මුදල ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ කමර්ාන්ත සේවා කායර්ාංශය මගින් ඉදිරියේදී ලබාදීමට නියමිතය. එතෙක් නිලධාරීන්ට ඇතිවන අපහසුතාවය අවම කිරීම සඳහා උපරිම රු: 14,000.00 ක මුදලක් අදාල කොට්ඨාශයේ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියෙන් නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත වියදම් දැරීම සඳහා 2023.09.20 දින පැවැති සමෘද්ධි බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය මගින් මාණ්ඩලික පත්‍රිකා අංක 2023/121/05 යටතේ අනුමැතිය ලබාදී ඇත.

06. මෙහිදී පුහුණු වැඩමුළුවට සහභාගී වූ නිලධාරියාට මෙම රු: 14,000.00 ක මුදල තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙළඳපොල සමීක්ෂණය කිරීමේදී වැයවන ගමන් වියදම් වෙනුවෙන් පළමුව රු: 5000,00 සහ දෙවනුව රු: 9,000.00 ලෙස පියවර දෙකකදී සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියෙන් ලබාගත හැක. මෙම නිලධාරියා නමින් මෙම මුදල ලබාදුන්නද වෙළඳපොල සමීක්ෂණයට සම්බන්ධ වූ සියළු නිලධාරීන් අතර, සමීක්ෂණයට සම්බන්ධ වූ ආකාරය අනුව යම්කිසි අනුපාතයකට ලබාගත හැකිවේ.

1 වන අදියර, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල/ 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல/ 1st Step, 4th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line: 0112-889007 | | | Hot Line: 011- 2887722 |

මෙහිදී පහත පරිදි ගිණුම් සටහන් තැබීමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන මෙන් කාරුණිකව දන්වමි.

| | |
|---|---|
| බාහිර ආයතන/ සංවිධාන වලින් ප්‍රතිපූරණය කරගත | |
| යුතු අරමුදල් ගිණුම | - හර (කේත අංකය 7309) |
| ජංගම ගිණුම/ මුදල් ගිණුම | - බැර |

07.යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක නිලධාරියෙකු දැනටමත් වෙළඳපොල සමීක්ෂණය අවසන් කර ඇත්නම්, ඒ පිළිබඳව තහවුරු කරගෙන රු: 14,000.00 ක මුදල එක්වර එම නිලධාරියාට ගෙවීමට සමෘද්ධි බැංකු සමිති කළමනාකරුට හැකියාව පවතී.

08. වෙළඳපොල සමීක්ෂණයට අදාළව මේ සඳහා නිලධාරීන් සම්බන්ධ වූ බවට සනාථ කර ලිඛිත සටහනක්, සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කලමනාකරු විසින් මුදල් බැර කළ යුතු සමෘද්ධි බැංකු සමිතියේ ගිණුම් අංකය ද සමග කමර්ාන්ත සේවා කායර්ාංශය වෙත ලියාපදිංචි තැපැලෙන් යැවීමෙන් මෙම මුදල් ආපසු ලබාගත හැකිවේ.

ඉදිරියේදී මුදල් ලද විගස ප්‍රතිපූරණ මුදල පියවීමට අදාල ගිණුම් සටහන පහත වේ.

| | |
|---|---|
| ජංගම ගිණුම | -හර |
| බාහිර ආයතන/ සංවිධානවලින් ප්‍රතිපූරණය කරගත | |
| යුතු අරමුදල් ගිණුම | -බැර (කේත අංක 7309) |

09.ප්‍රතිපූරණ මුදල් අදාළ ආයතනයෙන් නොලැබුනු විටක අධ්‍යක්ෂ (අලෙවි), අධ්‍යක්ෂ (මහ සංගම්) වෙත ලිඛිතව දන්වා අවශ්‍ය මුදල් ලබාගැනීම කඩිනම් කරගත යුතු බව ද දන්වමි.

මේ සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමුකර මෙම ගෙවීම් කටයුතු නිවැරදිව සිදුකරනු ඇතැයි හුදෙක්ම බලාපොරොත්තු වෙමි.

ආර්. පී. බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

| | | |
|---|---|---|
| 01. | අධ්‍යක්ෂ - මහ සංගම් | - අ.ක.ස. |
| 02. | අධ්‍යක්ෂ - අලෙවි (රා.ආ.) | -අ.ක.ස. |
| 03. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | -අ.ක.ස. |